**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - 2017**

---------------------------------------------------------------------------------

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කළ නොහැකි වුවද ණයහිමි ගිණුමේ රු.3,278,097 ක් වූ හර ශේෂ ණයහිමි බැර ශේෂයෙන් හිලව් කර රු.50,240,155 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු.372,865 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.8,160,942 ක් ලෙස දක්වා තිබුණද, නිවැරදි ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.2,816,645 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.5,344,297 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.70,342,795 ක් ලෙස දක්වා තිබුණද දේපළ, පිරියත හා උපකරණවලට අදාළ ලෙජර් ගිණුම් පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය තුළදී එම වත්කම් මිලදී ගැනීම සඳහා මුදලින් කරන ලද ගෙවීම රු.42,063,057 ක් බව නිරීක්ෂණය විය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ සඳහා නිකුත් කළ රු.6,002,443 ක් වූ රසායනික ද්‍රව්‍ය තොගය වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම වෙනුවට අවසන් තොග ගිණුමට හර කිරීම හේතුවෙන් අවසන් තොගය රු.6,002,443 ක් වැඩියෙන් හා රසායනික ද්‍රව්‍ය පරිභෝජන වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ලද රු.810,000 ක් වටිනා උපකරණ හා රු.119,000 ක් වටිනා පරිගණකවලට අදාළ 2017 වර්ෂයේ ක්ෂය රු.79,568 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි හා මෝටර් රථ අලුත්වැඩියාව සඳහා දරන ලද රු.5,406,380 ක් වූ පුනරාවර්තන වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගොඩනැගිලි හා මෝටර් රථ ගිණුම්වලට හරකර තිබුණි.

(ඈ) නව තාක්ෂණික විද්‍යාගාර සංකීර්ණයේ නිර්මාණය හා ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා සැපයූ ආයතනයට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක අත්තිකාරම් සමග බදු මුදල් ලෙස රු.2,056,756 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවීමට නිර්දේශකර තිබුණද උපචිත වියදම් ලෙස රු.1,843,915 ක් පමණක් ගිණුම්ගත කිරීමෙන්, කෙරීගෙන යන වැඩ සහ ණයහිමියෝ රු.212,841 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී රක්ෂණ වන්දි ලැබීම් රු.469,340 ක් මෝටර් රථ ගිණුමට බැර කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ මෝටර් රථ වටිනාකම රු.469,340 ක් අඩුවෙන්ද වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඊ) නාරා ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු සියයට 30 ක් වූ පුරස්කාර ආදායම් රු.506,253 ක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට උපදේශන ආදායම් බෙදාහැරීම් ලාභය මත ගෙවනු ලබන සියයට 30 ක දිරි දීමනා යටතේ වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් නාරා ආයතනයට ආරක්ෂක සේවාව ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.3,174,489 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දැක්වුවද, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ලබාගත් තොරතුරු අනුව එම හිඟ මුදල රු.6,481,007 ක් බව නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

වර්ෂ 02 කට වැඩි කාලයක් සිට පැවතෙන උපචිත වියදම් රු.5,574,590 ක් සඳහා ගෙවීම හා බැදීම් වටිනාකම් සකස්කර ගැනීමට අවශ්‍ය ඉන්වොයිස් හා ශේෂ සනාථන වැනි මූලාශ්‍ර ලියකියවිලි ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ධීවර වරායන් 06 ක් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකින් වර්ෂ 04 කට වැඩි කාලයක සිට ලැබිය යුතු රු.1,612,898 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂය තුළදී ජනාධිපති ලේකම් කාර්යාලයට නිදහස් කරන ලද සේවකයන් වෙනුවෙන් අයවිය යුතු රු.239,550 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2010 වර්ෂයේදී බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් වශයෙන් රු.404,010 ක් ගෙවා තිබුණි. නමුත්, එම මෘදුකාංග පද්ධතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ස්ථාපනය කර නොතිබුණු බැවින් එම මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා සහ ණය මුදලක් වශයෙන් ආයතනය විසින් සේවකයන් දෙදෙනෙකුට ගෙවා තිබූ රු.125,900 ක් වර්ෂ තුනක සිට අයවිය යුතුව පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත | |
| (i) පනතේ 17 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව විද්‍යාත්මක හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීම හේතුවෙන් පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ යෝජනා භාර ගැනීම, ඇගයීම, අනුමත ව්‍යාපෘතිවල ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ කමිටුව වෙත යොමු කරනු ලබන විද්‍යාත්මක හෝ කාර්මික කරුණු සම්බන්ධයෙන් උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. |
| (ii) පනතේ 34 වගන්තිය | නියෝජිතායතනය විසින් සිදුකරනු ලබන අධ්‍යයන පර්යේෂණ , අත්හදා බැලීම් හා වෙනත් විමර්ශන සහ ගවේෂණ හා සොයාගැනීම්වලට අදාළව ලබාගන්නා ලද දත්ත, වාර්තා සහ විස්තර අඩංගු ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i)මුදල් රෙගුලාසි 104 | 2009 වර්ෂයේදී රු.411,000 කට මිලට ගෙන තිබුණු පරිගණක මෘදුකාංගයක් ඇතුළත් කරන ලද පිරිවැය රු.52,000 ක් වූ පරිගණකයක් 2012 වර්ෂයේදී අස්ථානගත වී තිබීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii)මුදල් රෙගුලාසි 387 සහ 395 | බැංකු ගිණුම් 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී බැංකු සැසඳුම් ප්‍රකාශන සකස්කර නොතිබුණු අතර එක් බැංකු ගිණුමක රු.4,352 ක අයිරා ශේෂයක් පැවතුණි. |
| (iii)මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ
--------------------------

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය
------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,234,444 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,224,167 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.37,458,611 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදානයන් රු.43,409,230 කින් වැඩි වුවද සේවක පාරිශ්‍රමික, පර්යේෂණ හා සංවර්ධන වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් එකතුව රු.72,315,322 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 06 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවයක් ඇති වී තිබුණද 2016 වර්ෂයේදී අතිරික්තයක් ඇති වී නැවත 2017 වර්ෂයේ දී නැවත ඌනතාවයක් ඇති වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.123,494,212 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු.369,678,999 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
-----------------

(අ) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතන පනතේ විධි විධාන අනුව නියෝජිතායතනය විසින් මිරිදිය ජලාශවල මත්ස්‍ය අස්වනු ප්‍රවර්ධනය කිරීම පිළිබඳව හා පසු අස්වනු ප්‍රවර්ධනය පිළිබඳව සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර උපදෙස් නිකුත්කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී පර්යේෂණ ව්‍යාපෘති 74 ක් සඳහා රු.මිලියන 230 ක් ප්‍රතිපාදන සලස්වා තිබූ අතර ඉන් වැඩසටහන් / ව්‍යාපෘති 68 ක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 108.29 ක් වැයකර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 24 සිට සියයට 98 දක්වා වූ පරාසයක පැවති අතර පරීක්ෂාවට ලක් කරන ලද ව්‍යාපෘති 68 කින් 14 ක නිරීක්ෂණය වූ දුර්වලතා පහත දැක්වේ.

(i) මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් හා රේඩියෝ බෝයාවන් යොදා ගැඹුරු මුහුදේ බලයන් ඇල්ලීම සඳහා පරිසර හා සම්පත් හිතකාමී නව පන්නයක් සැදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී රු.1,412,535 ක් වැයකර මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් 03 ක් නිර්මාණය කර තිබුණි. එයින් එක් ඇටවුමක් පමණක් 2016 සැප්තැම්බර් 29 දින කල්මුනේ ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු අතර ඉතිරි ඇටවුම් 02, 2018 ජූලි මාසය වන විටත් නිෂ්කාර්යව තිබුණි. ස්ථාපනය කරන ලද මසුන් ඒකරාශී කිරීමේ ඇටවුමද 2017 වර්ෂයේදී ධීවරයන් විසින්ම කපා ඉවත්කර තිබුණි. මේ හේතුවෙන් වැය කරන ලද රු.1,412,535 නිෂ්කාර්ය වියදමක් වී තිබුණු අතර ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ii) හම්බන්තොට දිස්ත්‍රික්කය ආශ්‍රිතව ප්‍රජා සහභාගීත්වය තුළින් විසිතුරු මත්ස්‍ය වගාව සහ රෝග කළමනාකරණය සඳහා ඉකුත් වර්ෂයේදී රු.1,223,300 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසය තුළදී මඩ පොකුණු තුළ මත්ස්‍ය පැටවුන් තැන්පත් කළ යුතුව තිබුණද එය ආරම්භ කර තිබුණේ ජූලි 28 දින වන අතර ජලාශවල ජලය නොමැතිවීම හේතුවෙන් මත්ස්‍යයින් මිය යාම නිසා ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. තවද රෝග කළමනාකරණය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබූ අතර පසු විපරම් කටයුතු සහ ඇගයීම්ද සිදුකර නොතිබුණි.

(iii) කළපුවල පාවෙන දැල් කූඩු ආශ්‍රිත මොදා මත්ස්‍ය ඇඟිල්ලන් වගාව සඳහා මත්ස්‍ය ආහාර වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන පර්යේෂණ ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2017 වර්ෂය අවසාන වන විට ඒ සඳහා රු.2,231,174 ක් වැය කර තිබුණි. පර්යේෂණ ව්‍යාපෘතිය ආවරණය වීම සඳහා අවශ්‍ය පුත්තලම් කළපු ආශ්‍රිත මුළු දැල් කූඩු 27 න් 12 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර ඉතිරි කූඩු 15 ස්ථාපිත කිරීමට 2017 වර්ෂය අවසානය තෙක්ම අපොහොසත් වී තිබුණි. දැල් කූඩු සඳහා මොදා මත්ස්‍යයන් සපයා ගැනීම 2018 ජුනි දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව මොදා මත්ස්‍ය ආහාර සංයුතීන් වැඩිදියුණු කිරීම සිදුවුවද, මත්ස්‍ය ආහාර සංයුතීන් අවසන් සමාලෝචනය සඳහා අවශ්‍ය ප්‍රමාණාත්මක අත්හදා බැලීම හා වැඩිදියුණු කළ ආහාර සංයුතීන් ප්‍රායෝගික භාවිතයට ලබාදී දැල් කූඩු ආශ්‍රිත මොදා මත්ස්‍ය ප්‍රවර්ධනය යන පර්යේෂණ ව්‍යාපෘතියේ සෙසු අරමුණු කරා ළඟාවී නොතිබුණි.

(iv) ශ්‍රී ලංකාවේ කුඩා සමුද්‍රික සහ විශාල සමුද්‍රික මත්ස්‍ය සම්පත් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,286,197 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය තුළින් මූලික වශයෙන්ම වර්ෂය තුළදී කුඩා සමුද්‍රිය ධීවර කර්මාන්තයෙන් සහ විශාල සමුද්‍රිය ධීවර කර්මාන්තයෙන් නෙලාගත් මත්ස්‍ය අස්වැන්න සම්බන්ධයෙන් දත්ත යාවත්කාලීන කිරීමක් සහ විශ්ලේෂණය කිරීමක් සිදුවුවද ශ්‍රී ලංකාවේ ඇති කුඩා සමුද්‍රිය සහ විශාල සමුද්‍රිය මත්ස්‍ය සම්පත තක්සේරු කර නොතිබුණු අතර දත්ත විශ්ලේෂණය කිරීමෙන් ලබාගන්නා වැදගත් නිරීක්ෂණ කුඩා සහ විශාල සමුද්‍රීය ධීවර කර්මාන්තයේ නිරතව සිටින ධීවරයන්ට ලබාදීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(v) ධීවර තොරතුරු මධ්‍යස්ථානය මගින් මාර්ගගත ක්‍රමයට පාරිභෝගිකයන්ට සේවා පහසුකම් සැපයීම සඳහා පරිගණක මෘදුකාංගයක් වැඩිදියුණු කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.710,000 ක් වෙන්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු ආරම්භකර නොතිබුණි.

(vi) ජාතික නාවික සිතියම් නිර්මාණය කිරීම පිළිබඳව භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- කොළඹ සිට වැලිගම දක්වා නාවික සිතියම නිර්මාණය කිරීම කාර්යය යටතේ 2017 වර්ෂයේදී නොගැඹුරු මුහුදේ වර්ග කිලෝමීටර් 900 ක් සහ ගැඹුරු මුහුදේ වර්ග කිලෝමීටර් 4756 ක ජල මිනුම් කටයුතු සිදුකිරීමට සැලැසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නොගැඹුරු මුහුදේ වර්ග කිලෝමීටර් 410 ක ජල මිනුම් කටයුතු පමණක් සිදුකර තිබුණ අතර ගැඹුරු මුහුදේ ජල මිනුම් කටයුතු සිදුකර නොතිබුණි.

- ත්‍රිකුණාමලයේ සිට පේදුරුතුඩුව දක්වා නාවික සිතියම නිර්මාණය කිරීම යටතේ සම්පූර්ණ සිතියමේ වර්ග කිලෝමීටර් 30,000 කින් වර්ග කිලෝමීටර් 21,410 ක ජල මිනුම් කටයුතු සමාලෝචිත වර්ෂයේදී සිදුකිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසාන වනවිට වර්ග කිලෝමීටර් 6,425 ක පමණක් මිනුම් කටයුතු සිදුකර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී කල්පිටිය කලපුව සඳහා නාවික සිතියමක් නිර්මාණය කිරීමට සැලසුම්කර තිබුණද ඊට අදාල ජල මිනුම් කටයුතු කිසිවක් 2017 වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

(vii) දැනට පවතින සහ විද්‍යාත්මකව වැඩිදියුණු කරන ලද බහුදින ධීවර යාත්‍රාවල සහ පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළෙහි පසු අස්වනු හානිය තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින සහ නව බහුදින යාත්‍රා සඳහා ඵලදායී ශීතකරණ පද්ධතියක් හඳුන්වා දීම සහ එම යාත්‍රාවල මත්ස්‍ය ගුණත්ව හානිය තක්සේරු කිරීම යන කාර්යයන් හඳුනාගෙන තිබුණි.

ඒ අනුව ධීවර යාත්‍රාවල අධි ශීතකරණ පද්ධතියක් සහිතව බහුදින යාත්‍රා නිර්මාණය කිරීම සඳහා රජයේ විශ්ව විද්‍යාලයකට රු.950,130 ක් ගෙවා උපදේශන සේවා වාර්තාවක් 2017 වර්ෂය තුළදී ලබාගෙන තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුළදී බහුදින යාත්‍රා සඳහා ඵලදායී ශීතකරණ පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව ශීතකරණ පද්ධතියක් සහිතව බහුදින යාත්‍රා හඳුන්වාදීමට නොහැකි වීම හේතුවෙන් දැනට පවතින සහ වැඩිදියුණු කළ ධීවර යාත්‍රාවල මත්ස්‍ය ගුණත්ව හානිය සංසන්දනය කරමින් තක්සේරු කිරීම සහ පසු අස්වනු හානිය අවම කරගැනීම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(viii) නෝර්වේ රාජ්‍යයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් තක්සේරු කිරීමේ ස්වාධීන සමීක්ෂණය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.14,500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.2,116,621 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව රු.12,383,379 ක් වියදම් අධි ඇස්තමේන්තුකර තිබුණු බවට නිරීක්ෂණය විය. තවද මෙම ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් සහ විස්තරාත්මක අයවැය පුරෝකථන පිළියෙල කර නොතිබුණි.

(ix) තෝරාගත් විශාල සමුද්‍රික මත්ස්‍යයින් තුළ ඇති බැර ලෝහ අංශුවල අවකාශයේ වෙනස්වීම පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතිය සහ මට්ටියන්ගේ විෂ අන්තර්ගතය හා පෝෂ්‍යදායීත්වය අධීක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.1,362,371 ක් සහ රු.1,955,463 ක් වැයකර තිබුණු නමුත් මෙම ව්‍යාපෘතිවලට අදාළ කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(x) ශ්‍රී ලංකා වෙරළාසන්න භූමිය අවට ඛණිජවැලි සංයුතීන් සහ ඛණිජ තැන්පතු පිළිබඳ පර්යේෂණ අතරවාරයේදී පර්යේෂණ හා සම්බන්ධ මූලික වගකීම් දරන පර්යේෂණ නිලධාරියාගේ සේවය අත්හිටුවා තිබූ අතර එම වගකීම, ප්‍රවීණතාව සහිත වෙනත් පර්යේෂණ නිලධාරියෙකු වෙත පැවරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. මේ සඳහා, රු.320,700 ක් වූ ප්‍රතිපාදනවලින් රු.180,242 ක් හෙවත් සියයට 56 ක මූල්‍ය උපයෝජනයක් සිදුකර තිබුණි.

(xi) සාගර නිරීක්ෂණ මධ්‍යස්ථාන සහ මුහුදු මට්ටම් නියාමනය කිරීමේ මධ්‍යස්ථාන ඇතිකිරීම් ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.790,794 ක් වැය කර තිබුණි. සාගර අනතුරු ඇඟවීම් පිළිබඳ අදාළ ආයතනවලට තාක්ෂණික සහාය සැපයීම මෙම මධ්‍යස්ථාන ඇතිකිරීමේ මූලික අරමුණක් වුවද, 2017 පෙබරවාරි සිට මෙම මධ්‍යස්ථානය මගින් තාක්ෂණික සහාය සැපයීම් කටයුතු අත්හිටුවා තිබුණි.

(xii) අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය මගින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘතියක් වූ මීගමුව, කඩොල්කැලේ උද්‍යාන කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා රු.159,042 ක් වැයකර තිබුණි. මෙම උද්‍යාන

කළමනාකරණ ව්‍යාපෘතියට නාම පුවරු 03 ක් සවිකිරීම, ආපන ශාලාවක් ඉදිකිරීම, වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම හා පස් පුරවා මංතීරු සකස් කිරීම ඇතුළු කාර්යයන් කිහිපයක් ඇතුළත් වුවද, ආපන ශාලාව ඉදිකිරීම, පස් පුරවා මංතීරු සැකසීම වැනි කාර්යයන් සම්පූර්ණයෙන් නිමවී නොතිබුණි.

(xiii) ජාතික සාගර හා සමුද්‍රජීවී විද්‍යා අංශය මගින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියක් වූ සාගර දත්ත පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 01 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර ඒ සඳහා රු.153,171 ක් වැයකර තිබුණි. නමුත් එම කාර්යය 2017 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කර නොතිබූ අතර මූල්‍ය උපයෝජනය සියයට 15 ක් පමණක් විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

නියෝජිතායතනයේ කල්පිටිය පර්යේෂණ මධ්‍යස්ථානය, කප්පරතොට නාරා ප්‍රාදේශීය මධ්‍යස්ථානය හා රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පිහිටි එකතුව රු.53,400,900 ක් වූ ඉඩම්, නියෝජිතායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

---------------------------------

නියෝජිතායතනයේ අරමුණුවලින් බැහැරව රු.15,245,000 ක් වැයකර බේරුවල ඉදිකර තිබූ මත්ස්‍ය අලෙවි සැල 2014 මාර්තු 21 දින සිට කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම ඉදිකිරීම්වලට අදාළ ඉඩම නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපනශාලාව සඳහා මිලදීගෙන තිබූ රු.120,000 ක් වූ තන්දූරි උඳුන සහ රු.352,800 ක් වූ පිඟන් සෝදන යන්ත්‍රය 2011 වර්ෂයේ සිට 2018 ජූලි 31 දින දක්වාම භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2014 අප්රේල් මාසයේදී රු.76,800 කට මිලදී ගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් 2018 සැප්තැම්බර් දක්වාම භාවිතා කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය කාර්යාලවල පවත්වාගෙන ගිය බැංකු ගිණුම් 03 ක රු.675 ක් 2002 වර්ෂයේ සිට හා බැංකු ගිණුමක රු.97,768 ක් 2015 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

**4.5 අනාර්ථික ගනුදෙනු**

---------------------

බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අධිබලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලදීගැනීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052 ක්ද බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.2,902,938 ක් ද වැයකර තිබුණු නමුත් එම නිෂ්පාදන කටයුතු අතරමග නතර කර තිබුණි.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

----------------------------------------------------------

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් පනාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක අයිතිය නියෝජිතායතනය වෙත පවරා ගැනීමෙන් තොරව ඉකුත් වර්ෂයේදී රු.552,906 ක් වැයකර ඉදිකිරීම් සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද එම ඉඩම පවරාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් නියෝජිතායතනයේ සම්පත්**

නිලධාරීන් හය දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතනවලට මුදාහැර නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.2,125,777 ක් ගෙවා තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියෝජිතායතනයෙහි පරිපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක 2016 අප්‍රේල් 30 දින සහ 2017 ඔක්තෝබර් 31 දින සිට පුරප්පාඩු වී පැවතුණු අතර එම තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීමට 2018 ජූලි 25 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වනවිට පර්යේෂණ කටයුතුවලට ඍජුවම සම්බන්ධ තනතුරු 27 ක පුරප්පාඩු 95 ක් සහ සහායක සේවා තනතුරු 25 ක පුරප්පාඩු 42 ක් පැවතුණි. මෙම තනතුරුවල පුරප්පාඩු දිගින් දිගටම පැවතීම නියෝජිතායතනයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපාන බවද නිරීක්ෂණය විය.

**5 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව නියෝජිතායතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී ඇති බව ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රශ්නාවලියට පිළිතුරු ලෙස දක්වා තිබුණි. එසේ වුවත් නියෝජිතායතනය විසින් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද , නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ දින 49 ක ප්‍රමාදයක් සහිතව එනම් 2018 අප්‍රේල් 18 දිනය. තවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය විසින්, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 21 ක් නිකුත් කර තිබූ අතර, ඉන් විමසුම් 05 කට පමණක් පිළිතුරු ලැබී තිබුණි. එම පිළිතුරුවලින් විගණන විමසුම්වල සඳහන් නිරීක්ෂණවලට අදාළව ගත් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ඇතුළත් කර නොතිබුණි.

(ආ) නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන විෂය පථයට, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, පද්ධති පාලනයන්, පොදු ලෙජරය හා මාසික ගිණුම්, ණය සහ අත්තිකාරම්, පර්යේෂණ ව්‍යාපෘති ප්‍රගතිය ඇතුළු පුළුල් විෂය පථයක් ඇතුළත් වුවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලුව නිලධාරීන් 04 දෙනෙකුට සීමාවී තිබුණි.

## 6.3 විගණන කමිටු

සමාලෝචිත වර්ෂයේදී නියෝජිතායතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.15,685,632 ක් වැය කරමින් ඉදිකර තිබූ "තරණී" යාත්‍රාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. 2014 නොවැම්බර් 12 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අදාළ යාත්‍රාව විකිණීමට කටයුතු කරන ලෙසට නියෝග කර තිබුණ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් විකුණා නොතිබුණි. කෙසේ වුවද මෙම යාත්‍රාව ඉදි කළ දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා යාත්‍රාවේ සේවයේ නියුතු ආරක්ෂක නිලධාරියකුගේ වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් රු.9,758,290 ක් වැයකර තිබුණි.

## 6.5 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.5.1 ප්‍රසම්පාදනය

නාවික පර්යේෂණ ගොඩනැගිල්ල ප්‍රතිස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව ICTAD ලියාපදිංචිය කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීම සඳහා 2017 නොවැම්බර් 02 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණද මෙම කමිටුවට සහභාගී වී තිබුණේ කමිටු සාමාජිකයන් දෙදෙනෙකු පමණි.

(ii) පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබූ කොන්ත්‍රාත්තුවට අදාල කොන්ත්‍රාත් ගිවිසුමේ, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය නිශ්චිතව දක්වා නොතිබූ අතර, පෞද්ගලික ආයතනය සමග එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම පරිදි, අළුත්වැඩියා කාර්යයන් නිමකිරීම සඳහා දින 63 ක කාලසීමාවක් දක්වා තිබුණි. කෙසේ වුවද, එම කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් 2018 මැයි මස ඉදිරිපත් වී තිබූ අතර අපේක්ෂිත කාල සීමාවට වඩා මාස 2 ½ ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

(iii) වටිනාකම රු.5,519,645 ක් වැය කරන ලද ගොඩනැගිල්ලේ වායු සමීකරණ පද්ධති හා අනෙකුත් අභ්‍යන්තර විදුලි පරිපථ කාර්යයන් ආයතනය විසින් නිම කිරීමට භාර ගෙන තිබුණි. මෙහි සමස්ථ අළුත්වැඩියා කාර්යයන් සඳහා 2017 ජූලි මස සිට 2018 ජූනි තෙක් වසරකට ආසන්න කාලයක් ගතවී තිබූ අතර 2018 සැප්තැම්බර් 19 දින වන විටත් උක්ත ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි මට්ටමට අළුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.1 පරිදි කොන්ත්‍රාත් පැකේජකරණය , ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය සලසා ගතහැකි ක්‍රමවේදයක් ලෙස යොදාගත යුතු වුවද මෙහිදී කොන්ත්‍රාත් පැකේජකරණයේ වාසි ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අභ්‍යන්තර විගණනය | - ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වීම සහ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | - පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) භාණ්ඩ සමීක්ෂණය | - වාර්ෂික සමීක්ෂණ සිදුකිරීම ප්‍රමාද වීම. |
| (ඈ) ණයගැතියෝ | - 2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂ සනාථන ලබා නොගැනීම. |
| (ඉ) මෙහෙයුම් පාලනය | - ධීවර ප්‍රජාව සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ධීවර කර්මාන්තය හා සම්බන්ධ ආයතනවල ගැටළු හඳුනාගෙන අවශ්‍ය සමීක්ෂණ, පර්යේෂණ හා උපදෙස් ලබාදීමට සැලසුම් නොකිරීම. |
| | - සිදුකරන ලද පර්යේෂණ ධීවර ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම, ඒවා සංවර්ධනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය උපදෙස් නිසි ලෙස ලබාදීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් නොමැතිවීම. |
| | - මිරිදිය ජලාශවල ජලය කාලීනව පරීක්ෂාව හා මිරිදිය මත්ස්‍ය ප්‍රවර්ධනය පිළිබඳ අවශ්‍ය පර්යේෂණ නොකිරීම. |
| | - මිරිදිය මත්ස්‍ය පසු අස්වනු පිළිබඳ සමීක්ෂණ නොකිරීම. |
| | - පර්යේෂණවලට අදාළ දත්ත රැස් නොකිරීම හා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු නොකිරීම. |
| | - පර්යේෂණ වාර්තා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පරිහරණය කිරීම සඳහා අවස්ථාව ලබානොදීම. |

| | |
|---|---|
| (ඊ) ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය | - ගිණුම්කරණ පද්ධතියට ගෙවීම් වවුචර්, රිසිට් පත් සහ ජර්නල් වවුචර් ඇතුළත් කිරීම, සහතික කිරීම සහ ලෙජරයට ඇතුළත් කිරීම එකම නිලධාරියෙකු වෙත පවරා තිබීම.<br><br>- ගිණුම්කරණ පද්ධතියෙහි පරිපාලක ලෙස මූල්‍ය අංශයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන මූල්‍ය අධ්‍යක්ෂවරයා කටයුතු නොකිරීම.<br><br>- මූල්‍ය අධ්‍යක්ෂවරයා දැනුවත් වීමෙන් තොරව ගිණුම්කරණ පද්ධතියෙහි දත්ත වෙනස්කිරීම, දත්ත මකා දැමීම සහ ව්‍යාජ දත්ත ඇතුළත් කිරීමට අවකාශය සැලසී තිබීම.<br><br>- ගිණුම්කරණ පද්ධතියට ප්‍රවේශවීම සඳහා නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණකට සහ රජයේ විගණන නිලධාරින්ට අවශ්‍ය පහසුකම් සලසාදී නොතිබීම.<br><br>- ගිණුම්කරණ පද්ධතියෙහි පොදු ලෙජරය තුළ ගිණුම් නිර්මාණය කිරීමේදී අනවශ්‍ය පරිදි ගිණුම් නිර්මාණය කර තිබීම හේතුවෙන් පොදු ලෙජරය පරිශීලනය කිරීම සහ ශේෂ පිරික්සුම පරිශීලනය කිරීම සංකීර්ණ වී තිබීම.<br><br>- ගිණුම්කරණ පද්ධතියෙහි ලෙජර් ගිණුම් කේතගතකර නොතිබීම හේතුවෙන් ශේෂ පිරික්සුම සහ ලෙජර් ගිණුම් සංසන්දනය කර පරීක්ෂා කිරීම ඉතා සංකීර්ණ වී තිබීම.<br><br>- යම් නිශ්චිත දිනකට වාර්ෂික අයවැයට අනුව සත්‍ය වියදම සංසන්දනය කරමින් අයවැය පාලනයක් පවත්වාගෙන යාමට හැකිවන අයුරින් ගිණුම්කරණ පද්ධතියෙහි පහසුකම සලසාගෙන නොතිබීම. |